# ව්‍යාපාර විදේශ මුදල් ගිණුම

**1.** නිමැවුමේ ස්වභාවය.

විදේශ මුදල් ව්‍යාපාර ගිණුම.

**2.** ගණුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ

**2.1** ආකර්ෂණීය පොළී අනුපාත

**2.2** නවතම පොළී අනුපාත සඳහා https://www.peoples.lk/interest-rates/ වෙබ් අඩවියට යොමුවන්න.

**2.3** ඔබේ ආයෝජනයට 100% පූර්ණ සුරක්ෂිතභාවය.

**2.4** ආමුඛ ප්‍රේෂණ ගාස්තු රහිතව විදේශ මුදල් ගිණුම් වලට බැර කෙරේ.

**3.** යෝග්‍යතාවය.

**3.1** ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිකරුවෙකු ගෙන් විදේශ විනිමය උපයන ශ්‍රී ලංකාවේ පදිංචි පහත සඳහන් පුද්ගලයින්.

i) ශ්‍රී ලංකාව තුළ පදිංචි තනි පුද්ගලයෙකු.

ii) තනි පුද්ගල හිමිකරු හෝ හවුල්කරුවන් බහුතරයක් ශ්‍රී ලංකාවේ පදිංචිව

සිටින ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද තනි හිමිකාරිත්වයක් හෝ හවුල්කාරිත්වයක් (හවුල් කරුවන් දෙදෙනෙකු සමඟ වන හවුල්කාරිත්වයක් ඇති අවස්ථාවක අවම වශයෙන් එක් හවුල්කරුවෙකුවත් ශ්‍රී ලංකාවේ පදිංචි අයෙකු විය යුතුය.)

iii) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්.

iv) 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක්.

v) අදාළ රේඛීය අමාත්‍යාංශයේ හෝ සුදුසු අධිකාරියේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්.

vi) බැංකුව සමඟ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් පවත්වාගෙන ගිය, මියගිය පුද්ගලයෙකුගේ දේපොළ වල අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පොල්මංකරුවෙකු, මියගිය අයගේ දේපොළ පරිපාලන කටයුතු අවසන් වන තෙක්; සහ,

vii) ක්‍රියා පටිපාටිය අවසන් වනතුරු බැංකුව සමඟ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් පවත්වාගෙන ගිය සමාගමක ග්‍රාහකයෙකු හෝ ඈවරකරුවෙකු.

**3.2** රාජ්‍ය නොවන සංවිධානයකට විදේශ මුදල් ව්‍යාපාර ගිණුමක් (ව්‍යා.වි.මු. ගි) විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර දෙනු නොලැබේ.

**4.** ගිණුම විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.

**4.1** පුද්ගලයන් සඳහා, ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත, ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ (ඡායාරූපය, විස්තර සහ වෙනස් කිරීම් සහිත පිටුවල) ඡායා පිටපතක්, ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න ආකෘති පත්‍රය, විදේශ ගිණුම්

සඳහා බදු අයකිරීම් අනුකූලතා පනත සඳහා වන ප්‍රකාශය, සහ බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් ඕනෑම ලියවිලි.

**4.2** තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර සහ සමාගම් සම්බන්ධයෙන්, ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත සහ සුදුසු පරිදි හඳුනා ගැනීමේ ලේඛන, ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න ආකෘති පත්‍රය, විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනත සඳහා වන ප්‍රකාශය, සහ බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් ඕනෑම ලියවිලි.

**4.3** ව්‍යාපාර විදේශ මුදල් ගිණුම විවෘත කිරීමට අදාළ වන පරිදි ඔවුන්ගේ සුදුසුකම් සනාථ කරන ලියකියවිලි.

**4.4** පුද්ගල කාණ්ඩයන්.

i) භාණ්ඩ අපනයන කරුවන් (වෙළඳ භාණ්ඩ).

ii) වෘත්තිය සේවා අපනයන කරුවන්.

iii) අතරමැදියන් ලෙස ප්‍රති අපනයන වෙළඳාමේ යෙදෙන පුද්ගලයන්.

iv) සංචාරක නියෝජිතයන් සහ චාරිකා මෙහෙයවන්නන්.

v) හෝටල් සහ ආපනශාලා.

vi) මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන්.

vii) විදේශ රැකියා ආයතන.

viii) ශ්‍රී ලංකාවේ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කරන ලද බලපත්‍ර ලාභී / බලය ලත් විදේශීය ප්‍රවාහනය කරන්නන් සහ අනෙකුත් සැපයුම් සේවා සපයන්නන්.

ix) ශ්‍රී ලංකාවේ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කරන ලද බලපත්‍ර ලාභී / බලය ලත් නැව් නියෝජිතයන්.

x) ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කරන ලද බලපත්‍ර ලාභී / බලය ලත් විකුණුම් නියෝජිතයන්.

xi) අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් බලපත්‍ර ලාභී බංකර් ක්‍රියාකරුවන්.

xii) වරාය පර්යන්ත ක්‍රියාකරුවන්.

xiii) ගුවන් සේවයේ පර්යන්ත සේවා සපයන්නන්.

xiv) නැව් මාර්ග සහ ගුවන් සේවා වෙත ආහාරපාන සපයන්නන්.

xv) තීරුබදු රහිත සාප්පු (බදු රහිත සහන යටතේ භාණ්ඩ හා සේවා සැපයීමට අවසර ලත් ව්‍යාපාරයක නියැලෙන).

xvi) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අවශ්‍යතා සහ / හෝ නිර්දේශ වලට අනුකූලව හෝ තාවකාලික ආනයන සහ අපනයන සැකසුම් (TIEP යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති, සහ භාණ්ඩ ආනයනය කරමින්, ඒවා සකසා එවැනි භාණ්ඩ සෘජු අපනයන කරුවන්ට සැපයීම් කරන වක්‍ර භාණ්ඩ අපනයනය කරන්නන්.

xvii) සංශෝධිත 2019 අංක 01 දරණ වාණිජ මධ්‍යස්ථාන රෙගුලාසියේ, මුදල් පනතේ 2(1) ඡේදය ප්‍රකාරව දේශීය වෙළඳපලට භාණ්ඩ / නිෂ්පාදන අලෙවි කිරීමට අවසර දී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටින ව්‍යවසායන්.

**5.** ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් විවෘත කිරීම වෙනුවෙන් ලේඛන අවශ්‍යතා පිළිබඳව වූ පිරික්සුම් ලැයිස්තුව.

**5.1** නිසි පරිදි සම්පූර්ණ කරන ලද ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය.

**a)** පුද්ගල ව්‍යාපාර ගිණුමක් වෙනුවෙන් ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත - ඉංග්‍රීසි.

https://www.peoplesbank.lk/roastoth/2021/12/550_New_2018-E.pdf

**b)** සීමිත සමාගමක් වෙනුවෙන් ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත - ඉංග්‍රීසි.

https://www.peoplesbank.lk/roastoth/2022/10/235-Eng.pdf

**c)** තනි පුද්ගල ව්‍යාපාරයක් වෙනුවෙන් ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත - ඉංග්‍රීසි.

https://www.peoplesbank.lk/roastoth/2023/10/232-Sole-Proprietorship-_english.pdf

**d)** හවුල් ව්‍යාපාර ගිණුමක් වෙනුවෙන් ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත - ඉංග්‍රීසි.

https://www.peoplesbank.lk/roastoth/2023/10/229-Partnership- _eng.pdf

**5.2** සියළුම බලයලත් අත්සන්කරුවන්ගෙන් අත්සන් කාඩ්පත් (සමාගම් ලේකම් / අදාළ අධිකාරිය විසින් සහතික කරන ලද).

**5.3** සියළුම අධ්‍යක්ෂකවරුන්ගෙන් හා බලයලත් අත්සන්කරුවන්ගෙන් තනි තනිව ලබාගත්, ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න (ඔ.ග.හ) ආකෘති පත්‍රය සහ විදේශ ගිණුම් සඳහා බදු අයකිරීම් අනුකූලතා පනත සඳහා වන ප්‍රකාශයන්.

**5.4** සියළුම අධ්‍යක්ෂකවරුන්ගෙන් හා බලයලත් අත්සන්කරුවන්ගේ / තනි හිමිකරුගේ / හවුල් කරුවන්ගේ විදේශ ගමන් බලපත්‍රවල සහ ජාතික හැඳුනුම්පත් වල සහතික කළ පිටපත්.

**5.5** සියළුම කොටස් හිමියන්ගෙන් ලබා ගත් ප්‍රතිලාභී හිමිකරු ආකෘති පත්‍ර (සීමිත සමාගමක් සඳහා අදාළ වේ.)

**5.6** විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සඳහා අයදුම්පත්‍රය (E Statement).

**5.7** වන්දි ලිපිය (අවශ්‍ය නම්).

**5.8** සමාගම් ලේකම් විසින් සහතික කරන ලද සංස්ථාපන සහතිකයේ පිටපත / තනි පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපත / හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත.

**5.9** අධ්‍යක්ෂකවරුන්ගේ / බලයලත් අත්සන්කරුවන්ගේ නාම ලේඛනය, ඔවුන්ගේ අත්සන්ද සහිතව (සමාගමේ ලිපි ශීර්ෂයේ ලබා ගත්).

**5.10** සංගමයේ ව්‍යවස්ථාවේ පිටපත, ආ.ප.01 හෝ 20, ආ.ප.15 **(**සීමිත සමාගමක් සඳහා අදාළ වේ).

**5.11** සමාගම් ලිපි ශීර්ෂය මත සඳහන් කළ එහි අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව (සීමිත වගකීම් සමාගමක් සඳහා ආදාළ වේ).

a) මහජන බැංකුවේ එතෙර ගනුදෙනු සේවාවේ ගිණුමක් විවෘත කිරීම / අදාළ ශාඛාව.

b) ව්‍යාපාර විදේශ මුදල් ගිණුමේ මෙහෙයුම් උපදෙස්.

c) විද්‍යුත් ගිණුම් ප්‍රකාශ පහසුකම සඳහා බලයලත් විද්‍යුත් ලිපිනය.

d) ඇටෝර්නි බලපත්‍රයේ විස්තර (තිබේ නම්).

**5.12** ඉහත පුද්ගල කාණ්ඩයට අනුව විදේශ විනිමය ව්‍යාපාරය සත්‍යාපනය කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි ලේඛනය.

**6.** අවම ශේෂ අවශ්‍යතාවය

| **විදේශ මුදල්** | **ඉතුරුම් සහ ජංගම ගිණුම්** | **ස්ථාවර තැන්පතු ගිණුම්** |
|---|---|---|
| ඇමෙරිකානු ඩොලර් | 100/- | 1000/- |
| බ්‍රිතාන්‍ය පවුම් | 100/- | 750/- |
| යූරෝ | 100/- | 1000/- |
| ඕස්ට්‍රේලියානු ඩොලර් | 150/- | 1350/- |
| කැනේඩියානු ඩොලර් | 150/- | 1300/- |
| සිංගප්පූරු ඩොලර් | 150/- | 1500/- |
| ජපාන යෙන් | 12,000/- | 110,000/- |
| හොංකොං ඩොලර් | 800/- | 8000/- |
| නවසීලන්ත ඩොලර් | 150/- | 1500/- |
| ස්විස් ෆ්‍රෑන්ක් | 100/- | 1000/- |
| ස්වෙඩිෂ් ක්‍රෝනාර් | 900/- | 9000/- |
| ඩැනිෂ් ක්‍රෝනාර් | 700/- | 6500/- |
| නෝර්වීජියානු ක්‍රෝනාර් | 900/- | 8750/- |

| | | |
|---|---|---|
| චීන යුවාන් | 700/- | 6750/- |
| තායි භාට් | 3300/- | 33,000/- |
| ඉන්දියානු රුපියල් | 8000/- | 80,000/- |

**6.1** a) මූලික තැන්පතුවක් නොමැතිව ව්‍යාපාර විදේශ මුදල් ඉතුරුම් / ජංගම ගිණුමක් විවෘත කළ හැකිය.

b) වසර 2 කට වැඩි කාලයක් කිසිඳු ක්‍රියාකාරිත්වයක් නොමැති ගිණුම්, ආකාර්ය ගිණුම් ගණයට මාරු කරනු ලැබේ.

c) වසරකට වැඩි කාලයක් ශූන්‍ය ශේෂයක් සහිත ගිණුම් ස්වයංක්‍රියව වසා දමනු ලැබේ.

**7.** පොදු

**7.1** ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් ඉතුරුම්, ජංගම (චෙක්පත් අණකිරීමේ පහසුකම් නොමැතිව) හෝ ස්ථාවර තැන්පතු වශයෙන් ඕනෑම ව්‍යවහාර විදේශ මුදල් වර්ගයකින් විවෘත කොට පවත්වා ගෙන යා හැකිය. එනම්: ඇ.ඩොලර්, බ්‍රිතාන්‍ය පවුම්, යූරෝ, ඔස්ට්‍රේලියානු ඩොලර්, කැනේඩියානු ඩොලර්, හොංකොං ඩොලර්, සිංගප්පූරු ඩොලර්, ජපන් යෙන්, ස්විඩ්ශ් ක්‍රෝනර්, නිව්සීලන්ඩ් ඩොලර්, ඩෙන්මාර්ක් ක්‍රෝනර්, නෝර්වේජියන් ක්‍රෝනර්, චයිනීස් යුවාන්, ස්විස් ෆ්‍රෑන්ක්, තායි භාට් සහ ඉන්දියානු රුපියල්.

**7.2** ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගෙන් විදේශ ඉපයීම් සම්බන්ධයෙන්, ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් පවත්වාගෙන යාමට, අයදුම්කරුගේ සුදුසුකම් තීරණය කිරීම සඳහා ව්‍යාපාර විදේශ මුදල් ගිණුම විවෘත කරන අවස්ථාවේදී අදාළ අධිකාරි/රීන් විසින් අවසර දීම ඇතුළු ලේඛනමය සාක්ෂි ලබා ගත යුතුය.

**7.3** 2021.03.18 දිනැති 2021 අංක 09 දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානය යටතේ ව්‍යාපාර විදේශ මුදල් ගිණුම් හිමියන්ට සලසා ඇති අයිරා පහසුකමකින් හැරෙන්නට ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් අයිරා නොකළ යුතුය.

**7.4** පිළිවෙලින්, ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජෙනරාල් හෝ සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් බලපත්‍රලාභී ගිණුම් හිමියා නැව් නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු හෝ (සා.වි.නි.) වනවිට දේශීය ගාස්තු හෝ භාණ්ඩ ප්‍රවාහනයේ අංගයක් නොවන ගාස්තු ලෙස එකතු කරනු ලබන ගාස්තු සහ තැන්පතු ව්‍යාපාර විදේශ මුදල් ගිණුමට බැර නොකළ යුතුය.

**7.5** කිසිම අවස්ථාවක ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල් බවට පරිවර්තනය කර ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට බැර නොකළ යුතුය.

**8.** අවසර ලත් බැර

**8.1** භාණ්ඩ හා සේවා අපනයනය, ප්‍රති අපනයන වෙළඳාම, ගිණුම් හිමියා විසින් ගනු ලබන එතෙර ව්‍යාපෘති සහ ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුට දේශීයව සපයනු ලබන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් බැංකු පද්ධතිය හරහා විදේශ විනිමය වශයෙන් විදේශයෙන් ලැබෙන ප්‍රේෂණ.

**8.2** ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකු විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ගිණුම් හිමියා ප්‍රතිගහණය කළ විදේශ විනිමය.

**8.3** විදේශ විනිමය ප්‍රමාණය ඇ.ඩො. 15,000/- හෝ එයට සමානුපාතික වෙනත් විදේශ මුදල් වර්ගයකින් හෝ ඉක්මවන විට, රේගු දෙපාර්තුමේන්තුවට කරන ලද ප්‍රකාශයක් මත හෝ, එවැනි විනිමය ඇ.ඩො. 15,000/- කට සමාන හෝ අඩුවන වෙනත් විදේශ මුදල් වර්ගයක් හෝ වනවිට බැංකුවට සුදුසු ප්‍රකාශයක් මත හෝ ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ විනිමය.

**8.4** එකම ගිණුම් හිමියාගේ පුද්ගල විදේශ මුදල් ගිණුමෙන්, ව්‍යාපාර විදේශ මුදල් ගිණුමෙන් හෝ අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකින් (අ.වෙ.බැ.ඒ.ගි.) කෙරෙන මුදල් මාරු කිරීම්.

**8.5** ප්‍රවර්තන ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගේ අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකින් (අ.වෙ.බැ.ඒ.ගි.) කෙරෙන මුදල් මාරු කිරීම්.

**8.6** ගිණුම් හිමියා දේශීය නැව්/ගුවන් සමාගමක් වනවිට; විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ (සේවකයෙකුගේ) පුද්ගල විදේශ මුදල් ගිණුම වෙතින් කෙරෙන මාරුවීම්, ගිණුම් හිමියාට අයත් නැව්/ගුවන් යානා වල කාර්ය මණ්ඩල වැටුප්/වේතන සහ එවැනි සේවකයෙකුගේ ගෙවීමට නියමිත අනෙකුත් අදාළ ගෙවීම්;

**8.7** භාණ්ඩ සහ සේවා සැපයුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගේ විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා විදේශ මුදල් ගිණුමකින් මාරු කිරීම්.

**8.8** ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නැව්ගත කිරීමේ නියෝජිතයෙකු හෝ විකුණුම් නියෝජිතයෙකු නම්**;** අදාළ නියෝජිත ආයතන ගිවිසුම් යටතේ, එම කාර්යය සඳහා විදේශීය ප්‍රධානියාගෙන් හෝ ඔහු වෙනුවෙන් නම් කරන ලද තුන්වන පාර්ශවයකින් බැංකු පද්ධතිය හරහා විදේශ විනිමය වශයෙන් ලැබෙන ප්‍රේෂණ.

**8.9** ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නැව්ගත කිරීමේ නියෝජිතයෙකු හෝ විකුණුම් නියෝජිතයෙකු නම්; විදේශීය ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා විසින් විදේශ විනිමය වශයෙන් එකතු කරන ලද භාණ්ඩ ප්‍රවාහන හා මගී ගාස්තු ශ්‍රී ලංකාවේ බැංකු හුවමාරුවක් මගින් හෝ, ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට හෝ අක් වෙරල බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකට එරෙහිව බැංකුව විසින් නිකුත් කරන ලද බැංකු අණකර මගින්.

**8.10** ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයන ශ්‍රී ලාංකික පුරවැසියන්ට වේතන සහ/හෝ ඉපයීම් ලබා දීම සඳහා විදේශ සේවා යෝජකයෙකු සමඟ කටයුතු කර ඇති ශ්‍රී

ලංකාව තුල සංස්ථාපිත සමාගමක් නම්; අදාල විදේශ සේවා යෝජකයන්ගෙන් බැංකු පද්ධතිය හරහා විදේශයන්හි සිට විදේශ විනිමය වශයෙන් ලැබෙන ප්‍රේෂන හෝ එවැනි සේවා යෝජකයාගේ අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකින් මාරු කිරීම්;.

**8.11** ශ්‍රී ලංකාවේ වරායකින් හෝ ගුවන් තොටුපළකින් ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ පිටත්ව යන මගීන්ට (නේවාසික තත්ත්වය නොසලකා) සපයනු ලබන භාණ්ඩ හෝ සේවා සඳහා සලකා බලමින් තීරු බදු රහිත සහන යටතේ, අවසර ලත් ව්‍යාපාර කරගෙනු යනු ලබන ගිණුම් හිමියාට විදේශ විනිමය වශයෙන් ලැබෙන ගෙවීම්;

**8.12** ව්‍යාපාර විදේශ මුදල් ගිණුම හර කිරීමෙන් ලබා ගෙන ඇති විට ගිණුම් හිමියාගේ කුමණ හෝ විදේශීය වත්කම් වලින් ලැබෙන කිසියම් ආදායමක් හෝ ප්‍රාග්ධන ආදායමක්.

**8.13** ගිණුම් හිමියාගේ ව්‍යාපාර විදේශ මුදල් ගිණුම හර කිරීමෙන් හෝ ඔහුගේම ව්‍යාපාර විදේශ මුදල් ගිණුමෙන් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට මාරු කළ අරමුදල් වල දායකත්වයට සමානුපාතිකව යෙදවීමෙන් බාහිර ආයෝජන වලින් ලැබෙන යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ආදායමක් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් මාරු කිරීම.

**8.14** මුදල් ආයෝජනය කර ඇත්තේ ගිණුම් හිමියාගේ එම ව්‍යාපාර විදේශ මුදල් ගිණුම හර කිරීමෙන් වන විට, වෙනත් පුද්ගලයෙකුගේ (එනම් ගැනුම්කරුගේ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් අවසර ලත් විදේශ ආයෝජනයක් එවැනි ගැනුම්කරුවෙකුට විකිණීමෙන් ලැබෙන මුදල් මාරු කිරීම.

**8.15** ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මුල් ආයෝජනය කර ඇත්තේ, ගිණුම් හිමියාගේ ව්‍යාපාර විදේශ මුදල් ගිණුම හර කිරීමෙන් නම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල (ශ්‍රී.ලං.සං.බැ.) විදේශ මුදලින් කරන ලද ආයෝජන වලින් ලැබෙන කූපන් ආදායම විකුණුම්/කල්පිරීමේ ආදායම් සහ වෙනත් අදාල ලැබීම්.

**8.16** අවසරලත් හර කිරීම් යටතේ 5,6 සහ 7 යන කරුණු අනුව ව්‍යාපාර විදේශ මුදල් ගිණුමෙන් හර කරමින් ගිණුම් හිමියා විසින් ලබා ගන්නා ලද මුදලින් භාවිතයට නොගත් විදේශ මුදල්.

**8.17** ගිණුම් හිමියාගේ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමෙන් එවැනි විදේශ ගමන් කාඩ්පත සඳහා අරමුදල් සපයා ඇති මුදල දක්වා ඔහුගේ විදේශ ගමන් කාඩ්පතේ (වි.ග.කා.) ඉතිරිව ඇති භාවිතයට නොගත් ශේෂය.

**8.18** ගිණුම් හිමියා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ලං.ර.නි.කො.) විසින් නියාමනය කරනු ලබන රක්ෂණ සමාගමක් වනවිට, සුදුසුකම් ලත් පාරිභෝගිකයන්ට සහ සම-රක්ෂණකරුවන්ට නිකුත් කරන ලද විදේශ මුදල් වලින් රක්ෂණ ඔප්පු මත ලැබෙන රක්ෂණ වාරික සහ නැවත රක්ෂණය කරන්නන්ගේ හා ජාතික රක්ෂණ භාර අරමුදල (ජා.ර.භා.අ.) වෙතින් ලැබෙන හිමිකම්.

**8.19** ගිණුම් හිමියා සේවා යෝජකයෙකු වන විට; වැටුප් රැකියා සහ විශ්‍රාම ප්‍රතිලාභ වැඩිපුර ගෙවීම හෝ එවැනි සේවකයෙකුගෙන් ගෙවිය යුතු වෙනත් ගෙවීමක් වෙනුවෙන් ලංකාවේ සේවයේ නියුතු විජාතික හෝ ද්විත්ව පුරවැසියෙකුගේ පුද්ගල විදේශ මුදල් ගිණුමකින් කෙරෙන මාරු කිරීම.

**8.20** ගිණුම් හිමියා දේපොළ සංවර්ධකයෙකු වනවිට; ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගේ (එනම් ආයෝජකයාගේ) ආමුඛ ආයෝජන ගිණුමකින් (ආ.ආ.ගි.) නිශ්චල දේපොළ විකිණීමෙන් එම ආයෝජකයාට ලැබෙන ගෙවීම්.

**8.21** ගිණුම් හිමියා දේපොළ සංවර්ධකයෙකු වනවිට; 2021 මාර්තු 18 දිනැති 2021 අංක 11 දරණ උපදෙස් මගින් අවසර දී ඇති පරිදි, වෙනත් රටක ස්ථිර පදිංචිය සඳහා වීසා බලපත්‍රය මත ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි ශ්‍රී ලාංකිකයෙකුගෙන් හෝ ද්විත්ව පුරවැසියෙකුගෙන් හෝ ලැබුණු ගෙවීම් මත විදේශ ණය මුදල් ගිණුමකින් (වි.ණ.මු.ගි.) මුදල් මාරු කිරීම.

**8.22** විදේශ විනිමය පනතේ 8(3) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටතදී ගිණුම් හිමියාගෙන් ඇරඹෙන ප්‍රේෂණ.

**8.23** ඉහත ලැයිස්තුගත කර ඇති පුද්ගල කාණ්ඩය යටතේ සිටින පුද්ගලයෙකු වන ගිණුම් හිමියා විසින්, භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වෙනත් ව්‍යාපාර විදේශ මුදල් ගිණුම් වලින් හෝ අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුම් වලින් හෝ කෙරෙන මාරු කිරීම්.

**8.24** ගිණුමේ තිබූ මුදල් මත විදේශ මුදලින් උපයා ගත් පොළිය.

**8.25** ගිණුම් හිමියා දේශීය අධ්‍යාපන ආයතනයක් වනවිට; විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ පුද්ගල විදේශ මුදල් ගිණුම් වලින් (විගමනිකයන් හැර) කෙරෙන මාරුවීම්, පාඨමාලා හෝ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති ඔවුන්ගේ ආසන්නතම පවුලේ සමාජිකයන් සම්බන්ධයෙන් උපකාරක පන්ති ගාස්තු.

**8.26** 2021 අංක 11 දරණ කොළඹ වරාය නගර ආරක්ෂක කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව කොළඹ වරාය නගරයේ සහ බල ප්‍රදේශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවසර ලත් බලය ලත් පුද්ගලයෙකුගේ විදේශ මුදල් ගිණුමකින් විදේශ විනිමය පනතේ රෙගුලාසි උපලේඛනයේ 2 වන ඡේදයේ (3) උප ඡේදය ප්‍රකාරව, ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට සුදුසුකම් ඇති ගිණුම් හිමියාට ලැබෙන විදේශ විනිමය ඉපැයීම්/ගෙවීම්.

**9** අවසරලත් හර

**9.1** ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සඳහා ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකෙරෙන ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ.

**9.2** ශ්‍රී ලංකාවේදී, ශ්‍රී ලංකා රුපියල් වලින් වූ මුදල් ලබා ගැනීම.

**9.3** පුද්ගල විදේශ මුදල් ගිණුමකට, ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට හෝ එම ගිණුම් හිමියාගේම අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට කෙරෙන මාරු කිරීම්.

**9.4** ප්‍රවර්තන ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගේ අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට මාරු කිරීම්.

**9.5** 2021 මාර්තු 18 දිනැති 2021 අංක 02 දරණ ශ්‍රී ලංකා මහ බංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) උපදෙස් වලට අනුව, ඇ.ඩො. 5000/-ක් දක්වා විදේශ මුදල් (හෝ එයට සමානුපාතික වෙනත් ඕනෑම මුදල් වර්ගයක්) විදේශ මුදල් නෝට්ටු වලින් ආපසු ලබා ගැනීම හෝ සංචාරක අවශ්‍යතා වෙනුවෙන් විදේශ ගමන් කාඩ්පත උඩුගත කිරීම සඳහා මුදල් මාරු කිරීම.

**9.6** ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරියෙන් ලබා ගත් තහවුරු කිරීමක් මත, කපා ඔප දැමූ හෝ රළු මැණික් ගල් සහ අනෙකුත් අමුද්‍රව්‍ය විදේශයන්හිදී මිලදී ගැනීම සඳහා මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන් විසින් වරකට ඇ.ඩො. 50,000/-හෝ එයට සමානුපාතික වෙනත් ඕනෑම මුදල් වර්ගයක්) දක්වා විදේශ මුදල් නෝට්ටු ආපසු ගැනීම.

**9.7** ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු හෝ නැව්ගත කිරීමේ නියෝජිතයෙකු වනවිට; විදේශ ප්‍රධානියාගෙන් හෝ ඔහු වෙනුවෙන් නම් කරන ලද තෙවන පාර්ශවයන්ගෙන් ලැබෙන ආමුඛ ප්‍රේෂණ වලට එරෙහිව, බැංකුවට කෙරෙන පිළිගත හැකි හේතු සහිත ඉල්ලීමක් මත “Cash-to-Masters” ලෙස ඇමතුමක් සඳහා එක් නැවකට ඇ.ඩො. 50,000/-ක් (හෝ එයට සමානුපාතික වෙනත් ඕනෑම මුදල් වර්ගයක්) දක්වා විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම.

**9.8** විදේශයන්හි ණය දෙන්නෙකුගෙන් ලබා ගත් විදේශ මුදල් ණය ආපසු ගෙවීමේ / සේවාව සඳහා එම ගිණුම් හිමියාගේ (එනම් ණය ගැනුම්කරුගේ) විදේශ වාණිජ ණය ගැනීමේ ගිණුමට මාරු කිරීම.

**9.9** ණය සේවා වියදම් සහ ගිණුම් හිමියා විසින් බැංකුවකින් ලබා ගත් විදේශ මුදල් ප්‍රමාණයන් ආපසු ගෙවීම ඇතුළුව ව්‍යාපාර විදේශ මුදල් ගිණුමකට මුදල් මාරු කිරීම.

**9.10** 2017 නොවැම්බර් 20 දින සිට ගිණුම් හිමියා (එනම් ණය ගැනුම්කරු) විසින් උපදෙස් දෙන දිනය දක්වා කාලය තුළ එවැනි ණය දෙන්නෙකුගෙන් ලබා ගත් විදේශ මුදල් ණය ආපසු ගෙවීම හේතුවෙන් විදේශයන්හි ණය දෙන්නෙකුගේ ආමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම.

**9.11** ගිණුම් හිමියාගේ ව්‍යාපාර විදේශ මුදල් ගිණුමේ අරමුදල් භාවිතා කරමින් විදේශ මුදල් වලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම වෙනුවෙන් කෙරෙන මාරු කිරීම්.

**9.12** විකුණුම්කරු විසින් එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා විදේශයන්හි අවසර ලත් ආයෝජනයක් මිලදී ගැනීම වෙනුවෙන් සිදු කරන ලද, වෙනත් පුද්ගලයෙකුගේ (එනම් විකුණුම්කරුගේ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් සිදුවන මාරු වීම්.

**9.13** ගිණුම් හිමියා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගමක් නම්; දේශීය හෝ විදේශීය ප්‍රති-රක්ෂණකරුවන්ට සහ ජාතික රක්ෂණ භාර අරමුදල හා තැරැව්කාර ගාස්තු සඳහා විදේශීය මුදලින් නම් කරන ලද රක්ෂණ වාරික සම්බන්ධයෙන් සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට සහ සම-රක්ෂණකරුවන්ට හිමිකම් ගෙවීම්.

**9.14** ගිණුම් හිමියා ආයෝජකයෙකු, කුලී නිවැසියෙකු හෝ ගැනුම්කරුවෙකු වනවිට; ආමුඛ ආයෝජන ගිණුම් සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ උපදෙස් මඟින් අවසර ලබා දී ඇති පරිදි, ආමුඛ ආයෝජන ගිණුමේ, එවැනි හිමිකරුගේ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන ගනුදෙනුවලට ආරෝපණය කරන ලද කිසියම් ආදායමක් හෝ ප්‍රාග්ධන ආදායමක් ගෙවීමක් වන ආමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම.

**9.15** ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයන ශ්‍රී ලාංකික පුරවැසියන්ට වැටුප් සහ / හෝ ඉපැයීම් ලබා දීම සඳහා විදේශ සේවා යෝජකයෙකු සමඟ කටයුතු කර ඇති, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් වන විට, අදාළ සේවකයින්ගේ පුදගල විදේශ මුදල් ගිණුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් වෙත මාරු කිරීම්.

**9.16** ගිණුම් හිමියා දේශීය නැව්ගත කිරීමේ / ගුවන් සමාගමක් වන විට; එවැනි නැව් / ගුවන් යානා වල විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ පුද්ගල විදේශ ගිණුම් වෙත, කාර්ය මණ්ඩල වැටුප් / වේතන සහ වෙනත් අදාළ රැකියා ප්‍රතිලාභ ගෙවීම.

**9.17** පුද්ගල කාණ්ඩය යටතේ “ඉහත ලැයිස්තු ගත කර ඇති” පුද්ගල කාණ්ඩයක් වන ගිණුම් හිමියා විසින් භාණ්ඩ මිලදී ගැනීම හා සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අක් වෙරළ බැංකු ඒකකයේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් හෝ වෙනත් ව්‍යාපාර විදේශ මුදල් ගිණුම් හෝ වෙත කෙරෙන මාරු කිරීම්.

**9.18** විදේශ විනිමය පනතේ 8(3) වගන්තිය ප්‍රකාරව එවැනි අරමුදල් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති පුද්ගලයෙකු වශයෙන් ගිණුම් හිමියාගේ ඕනෑම කටයුත්තක් සඳහා ප්‍රතිමුඛ මුදල් ප්‍රේෂණ.

**9.19** 2021 ජූලි 30 දිනැති ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධාන මාලාවේ 2021 අංක 26 දරණ උපදෙස් වලට අනුව විවෘත කරන ලද විශේෂ විදේශ මුදල් ගිණුමකට (වි.මු.ගි.) විදේශ විනිමය ඉපැයීම් මාරු කිරීම සහ ගිණුම් හිමියා විසින්, රෙගුලාසි යටතේ අවසර දී ඇති පරිදි කොළඹ කොටස් වෙළඳපොලේ නම් කරන ලද විදේශ මුදලින් ලැයිස්තු ගත කළ කොටස් හෝ ණය සුරැකුම් සම්බන්ධයෙන්, සුදුසුකම් ලත් ආයෝජකයින් විසින් කරන ලද ආයෝජන වලට ආරෝපණය කළ ඕනෑම ආදායමක් හෝ කල් පිරීමේ ආදායමක් ගෙවීම සඳහා.

**10.** ගාස්තු සහ අය කිරීම්

අනුපාත සහ බදු අයක්‍රම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

**https://www.peoplesbank.lk/roastoth/2024/10/Foreign-English.pdf**